## Special Paper

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2020 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2020

ගිණුම්කරණය II
கணக்கடு II
Accounting II

33 S II

පැය තුනයි
மூன்று மணத்தியாலம்
*Three hours*

**උපදෙස් :**

- **පළමුවන හා දෙවන ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- **සෑම ප්‍රශ්නයකටම පිළිතුරු ලිවීම අලුත් කඩදාසියකින් අරඹන්න.**
- **අදාළ පෙරවැඩ පිළිතුරු පත්‍රය සමග අමුණන්න.**

**01.** සී/ස ලුකා සමාගම නිෂ්පාදන හා වෙළඳාම් කටයුතු සිදුකරයි. 2020.03.31 දිනට සාරාංශගත ශේෂ පිරික්සුම පහත දී ඇත.

| විස්තරය | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| 2019.04.01 දිනට VAT ගිණුම | | 50 |
| විකුණුම් | | 8 500 |
| 2019.04.01 දිනට ආදායම් බදු වෙන් කිරීම | | 600 |
| 2019.04.01 දිනට ගොඩනැගිලි ප්‍රත්‍යාගණන සංචිතය | | 100 |
| කල්බදු ණයහිමියෝ | | 2 550 |
| විකුණුම් මත එකතු කළ VAT | | 420 |
| 2019.04.01 ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | | 1 000 |
| [කොටස් සංඛ්‍යාව 10 000] | | |
| 2019.04.01 දිනට රඳවාගත් ඉපැයුම් | | 290 |
| වෙළඳ ගෙවිය යුතු දේ | | 100 |
| 2019.04.01 වගකීම් සහතික වෙන් කිරීම් | | 200 |
| නිෂ්පාදන පිරිවැය | 1 800 | |
| බදු ගෙවීම් | 500 | |
| වැටුප් හා වේතන (පරිපාලන) | 630 | |
| ගැණුම් හා වියදම් මත ගෙවූ VAT | 200 | |
| 2020.03.31 අමුද්‍රව්‍ය තොග | 310 | |
| නිමි ද්‍රව්‍ය ගැණුම් | 2 600 | |
| 2019.04.01 වෙළඳ තොග | 140 | |
| 2019.04.01 දේපළ පිරියත හා භාවිත අයිතිය ඇති වත්කම් | 4 200 | |
| මුදල් හා මුදල් සමාන දෑ | 1 200 | |
| අධ්‍යක්ෂ සංවේතන | 450 | |
| අනෙකුත් පරිපාලන වියදම් | 320 | |
| බෙදාහැරීමේ වියදම් | 300 | |
| වෙළඳ ලැබිය යුතු දේ | 1 160 | |
| | 13 810 | 13 810 |

**අතිරේක තොරතුරු,**

2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර පහත දෑ සඳහා ගැලපීම් කළ යුතු වේ.

**(i)** 2019/2020 වර්ෂය සඳහා ගෙවිය යුතු ගොඩනැගිලි කුලිය රු. 250 000 කි. ගොඩනැගිලි වලින් $^{2}/_{5}$ ක් අදාල වන්නේ, කර්මාන්තශාලා සඳහා වන අතර ඉතිරිය පරිපාලන කටයුතු සඳහා භාවිතා කෙරේ.

**(ii)** වර්ෂය තුල ගෙවූ බදු සංයුතිය පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| එකතු කළ අගය මත බදු | රු. | 70 000 |
| 2018/2019 සඳහා අවසාන ආදායම් බදු | රු. | 350 000 |
| 2019/2020 සඳහා ආදායම් බදු | රු. | 80 000 |
| | රු. | 500 000 |

2019/2020 වර්ෂය සඳහා ආදායම් බදු ලෙස රු. 280 000 ඇස්තමේන්තු කර ඇත.

**(iii)** වෙළඳ තොගවල පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගයන් පහත පරිදි වේ.

| **තොගය** | **පිරිවැය (රු.)** | **ශුද්ධ උපලබ්ධි අගය (රු.)** |
|---|---|---|
| 2019.03.31 | 150 000 | 140 000 |
| 2020.03.31 | 260 000 | 280 000 |

2019.04.01 දිනට පැවති වෙළඳ තොගය 2019/2020 ගිණුම් වර්ෂය තුල සම්පූර්ණයෙන්ම විකුණා ඇත.

**(iv)** සමාගම වසරක වගකීම් සහතික කාලයක් සහිතව භාණ්ඩ විකුණන අතර, පසුගිය වසරේ සිදුකරන ලද විකුණුම් වෙනුවෙන් රු. 150 000 ක වගකීම් සහතික ගෙවීම් ප්‍රවර්තන වර්ෂය තුළ සිදු කර ඇත. එය බෙදාහැරීමේ වියදම් තුළ ඇතුළත් කර ඇත. 2020.03.31 දිනට වගකීම් සහතික ගෙවීම් සඳහා ප්‍රතිපාදනය විකුණුම් වලින් 2% ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

**(v)** 2019.04.01 දිනට දේපළ, පිරියත හා උපකරණ හා භාවිත අයිතිය ඇති වත්කම්හි පිරිවැය හා සමුච්චිත ක්ෂය සංයුතිය පහත පරිදි වේ.

| **වත්කම** | **පිරිවැය / සාධාරණ අගය (රු.'000)** | **සමුච්චිත ක්ෂය (රු.'000)** | **ධාරණ අගය (රු.'000)** |
|---|---|---|---|
| ගොඩනැගිලි - සාධාරණ අගය | 2 500 | 1 500 | 1 000 |
| උපකරණ - පිරිවැය | 1 000 | 200 | 800 |
| භාවිත අයිතිය ඇති මෝටර් රථ - පිරිවැය | 4 000 | 1 600 | 2 400 |
| | 7 500 | 3 300 | 4 200 |

සියලුම වත්කම් පරිපාලන කටයුතු සඳහා භාවිතා කෙරේ. ඒවා සියල්ලහි ජීව කාලය වර්ෂ 5 ක් ලෙස සලකා ක්ෂය කරනු ලැබේ.

**(vi)** 2020.03.31 දින ගොඩනැගිලි වල නව අගය රු. 300 000 ක් ලෙස සුදුසුකම්ලත් තක්සේරුකරුවකු විසින් අගය කර ඇත. ඒ පිළිබඳව සටහනක් කර නොමැත.

**(vii)** 2017.04.01 වර්ෂ 5 ක කාලයක් සඳහා කල්බදු පදනම මත ලබාගත් මෝටර් රථය සඳහා පහත තොරතුරු අදාල වේ.

වාර්ෂික කල්බදු වාරිකය රු. 1 100 000

වාර්ෂික කල්බදු පොලී

| **වර්ෂය** | **පොලිය (රු.'000)** |
|---|---|
| 2017/2018 | 400 |
| 2018/2019 | 350 |
| 2019/2020 | 300 |
| 2020/2021 | 250 |
| 2021/2022 | 200 |

වසර තුළ ගෙවූ කල්බදු වාරිකය වෙළඳ ණයහිමි ගිණුමට හර කර ඇති නමුත් වෙනත් කිසිඳු සටහනක් තබා නැත.

**(viii)** 2020.01.01 දින රු. 400 000 කට උපකරණ මිලට ගෙන ඇති අතර එය නිමි ද්‍රව්‍ය ගැණුම් ගිණුමේ වාර්තා කර ඇත.

**(ix)** පරිපාලන සේවකයින් සඳහා වැටුප් ගෙවීමේදී සේවක අර්ථ සාධක සඳහා 10% ක් අඩුකරගෙන මුදලින් ගෙවූ ශුද්ධ වැටුප පමණක් සටහන් කර ඇත. සේවක අර්ථ සාධක හා සේවක භාරකාර අරමුදල් සඳහා සමාගම විසින් 15% හා 5% බැගින් දායක වේ. 2019/2020 වර්ෂය සඳහා අදාල වෙන් කිරීම් සිදුකර නැත.

**(x)** 2020.03.31 දිනට තිබූ සෑම සාමාන්‍ය කොටස් 5 කට ම 1 ක් බැගින් ලෙස කොටසක් රු. 200 බැගින් රඳවාගත් ලාභය ප්‍රාග්ධනීත කර ඇත.

**අවශ්‍ය වන්නේ,**

ප්‍රසිද්ධ කිරීම සඳහා සුදුසු ආකෘතියක් භාවිතා කරමින් පහත මූල්‍ය ප්‍රකාශන (සටහන් ද ඇතුළුව)

**(1)** 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශය හා වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය.

**(2)** 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය.

**(3)** 2020.03.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය.

***[මුළු ලකුණු 40]***